**1.2. ප්‍රධාන වගකීම්**

| ප්‍රභේද | ප්‍රධාන ක්‍රියාකාරකම් | අපේක්ෂිත අවසාන ප්‍රතිඵලය | කාලය % |
|---|---|---|---|
| **1.මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.** | ➢ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුව මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ග්‍රාමීය සහ ප්‍රාදේශීය මට්ටමින් කමිටු පිහිට වූ බවට සහ ක්‍රියාත්මක කළ බවට තහවුරු කිරීම.<br>➢ ග්‍රාමීය සහ ප්‍රාදේශීය මට්ටමෙන් දිස්ත්‍රික් කමිටුව වෙත යොමු කරන ලද මුල් ළමාවිය විෂයට අදාළ ප්‍රධාන ගැටළු සඳහා සම්බන්ධීකරණය තුළින් විසඳුම් ලබාදීම සහ අනෙකුත් ගැටලු ජාතික හා පළාත් මට්ටම වෙත යොමු කිරීම.<br>➢ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ පළාත් කමිටුව සඳහා සහභාගීවීම.<br>➢ අවශ්‍ය අවස්ථා වලදී ප්‍රාදේශීය/ ග්‍රාමීය කමිටුව වෙත සහභාගීවීම. | ➢ කමිටු සම්බන්ධීකරණය මගින් මුල් ළමාවිය විෂයට අදාළ ගැටළු ජාතික මට්ටම වෙත යොමු කිරීම සහ ජාතික මට්ටමෙන් ගනු ලබන තීරණ දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීම සහ ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමට යොමු කිරීම. | 25 |
| **2.මෙහෙයුම් නියාමන සහ ඉගෙනුම් (Operations , Regulations & Learning's)** | ➢ ප්‍රාදේශීය මට්ටමින් පවතින දත්ත පද්ධති උපයෝගී කොටගත් දිස්ත්‍රික් දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.<br>➢ දත්ත පද්ධතියට අවශ්‍ය දත්ත රැස් කිරීමට අදාළ දෙපාර්තමේන්තු හා ආයතන දිස්ත්‍රික් මට්ටමින් සම්බන්ධීකරණය .<br>➢ මුල් ළමාවිය විෂය ක්ෂේත්‍රයට අදාළව,ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් යොදා ගනිමින් අවශ්‍ය අවස්ථා වලදී අධ්‍යන හා පර්යේෂණ සිදු කිරීම හා සම්බන්ධීකරණය කිරීම.<br>➢ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී පදනම් කර ගැනීම සඳහා ප්‍රමුඛව සැලකිය යුතු ගැටලු හා ඊට අදාල යෝජනා/වැඩසටහන් පිළිබඳව සෑම වර්ෂයකම අගෝස්තු මාසට පෙර අදාළ ආකෘති පත්‍ර යටතේ ප්‍රාදේශීය මට්ටමින් ගෙන්වා ගැනීම සහ මුල් | ➢ විධිමත් අයුරින් දත්ත පද්ධති පවත්වාගෙන යාම.<br>➢ විධිමත් අයුරින් දත්ත විශ්ලේෂණය කිරීම.<br>➢ අවශ්‍ය අවස්ථාවන් හිදී නිසි පරිදි අනෙකුත් ආයතනයන් සමඟ දත්ත බෙදා ගැනීම. | 20 |

| | | | |
|---|---|---|---|
| | ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.<br>➢ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් කැඳවන සියලුම පුහුණු සඳහා සහභාගීවීම.<br>➢ විෂයට අදාළ ව දැනුම හා කුසලතා යාවත්කාලීන කර ගැනීම සහ අත්දැකීම් හුවමාරුව. | | |
| 3.මුල් ළමාවිය සංවර්ධනයට අදාළව ධාරිතා සංවර්ධනය/දැනුවත් කිරීම, හා දිස්ත්‍රික් මට්ටමේ සම්බන්ධීකරණය | ➢ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවරියන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>➢ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවරු/පාලිකාවන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>➢ මුල් ළමාවියේ දරුවන්ගේ දෙමාපියන්, ගැබිනි මව්වරුන්, තරුණ කණ්ඩායම්, ප්‍රජාව, රාජ්‍ය සහ රාජ්‍ය නොවන නිළධාරීන් මුල් ළමාවියට අදාළව දැනුවත් කිරීම.<br>➢ නිවස පදනම් කරගත් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දෙමව්පියන් හා ප්‍රජාව දැනුවත් කිරීම.<br>➢ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් වාර්ෂිකව යොමු කරනු ලබන කාලීන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ප්‍රාදේශීය මට්ටමෙන් සම්බන්ධීකරණය කිරීම.<br>➢ මුල් ළමාවිය සංවර්ධනයට අදාළ සියලු වැඩසටහන් සම්බන්ධීකරණය සහ අවශ්‍ය අවස්ථාවලදී සම්පත්දායකත්වය ලබා දීම.<br>➢ මුල් ළමාවිය දරුවන්ගේ සමස්ථ සංවර්ධනයට අදාළව වැඩසටහන් සංවිධානය සහ ක්‍රියාත්මක කිරීම.<br>➢ අවම ප්‍රමිතීන් වලට අදාළව මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සංවර්ධනය කිරිම. | ➢ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනයට සෘජුවම දායක වන පාර්ශ්වයන්ගේ ධාරිතා සංවර්ධනය තුලින් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය දිස්ත්‍රික් මට්ටමින් තහවුරු කිරීම. | 10 |

| | | | |
|---|---|---|---|
| 4.මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය විෂය ක්ෂේත්‍රයට අදාළව හඳුනාගත් සුවිශේෂී වැඩසටහන් ක්‍රියාත්මක කිරිම හා සම්බන්ධීකරණය | ➢ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සතිය ක්‍රියාත්මක කිරීම.<br>- ඉහත වැඩසටහනට අදාළව දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය, ප්‍රාදේශීය මට්ටම වෙත අවශ්‍ය මැදිහත්වීම සිදු කිරීම සහ නියාමනය.<br>➢ ලෝක ළමා දිනය හා සම්බන්ධ කටයුතු ක්‍රියාත්මක කිරීම.<br>- ඉහත වැඩසටහනට අදාළව දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය, ප්‍රාදේශීය මට්ටම වෙත අවශ්‍ය මැදිහත්වීම සිදු කිරීම සහ නියාමනය.<br>➢ මුල් ළමාවිය ආදර්ශ ගම්මාන ව්‍යාපෘතියට අදාළව දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය, ප්‍රාදේශීය මට්ටම වෙත අවශ්‍ය මැදිහත්වීම සිදු කිරීම සහ නියාමනය.<br>➢ මුල් ළමාවිය දරුවන්ගේ සෞන්දර්යාත්මක හැකියාවන් ඔප්නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක සිතුවම් දැක්මට අදාළව දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය, ප්‍රාදේශීය මට්ටම වෙත අවශ්‍ය මැදිහත්වීම සිදු කිරීම සහ නියාමනය.<br>➢ ආපදා අවස්ථාවන්හි දී මුල් ළමාවිය දරුවන් වෙත සැපයෙන විශේෂ සේවාවන්ටඅදාළව දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය, ප්‍රාදේශීය මට්ටම වෙත අවශ්‍ය මැදිහත්වීම සිදු කිරීම සහ නියාමනය.<br>➢ මුල් ළමාවිය සංවර්ධන විෂය හා සම්බන්ධව ජාතික මට්ටමෙන් හඳුන්වාදෙන ලද නව සංකල්ප වලට අදාළව දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය, ප්‍රාදේශීය මට්ටම වෙත අවශ්‍ය මැදිහත්වීම සිදු කිරීම සහ නියාමනය.<br>➢ බරපතල අවදානමකට ලක්විය හැකි බවට ප්‍රාදේශීය මට්ටමින් සිතියම්ගත ගත කළ පවුල් අතරින් හඳුනාගත් දරුවන් (MVC-Most Vulnerable Children )වෙනුවෙන් | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනයට අදාළව හඳුනාගත් සුවිශේෂී වැඩසටහන් ක්‍රියාත්මක වීම සහතික කිරීම. | 10 |

| | | | |
|---|---|---|---|
| | සිදු කරන මැදිහත්වීම් සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම.<br>➢ MVC සිතියම මගින් අධි අවදානම් බවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනාගත් විසඳාගත නොහැකි බවට ඉදිරිපත් වූ ගැටළු දිස්ත්‍රික් කමිටුව වෙත ඉදිරිපත් කර අදාළ මැදිහත්කරණයන් සිදු කිරීම.<br>➢ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් කැඳවන අධි අවදානම් දරුවන් පිළිබඳ දෙසති සමාලෝචන රැස්වීම් සඳහා කැඳවීම් ලද විට සහභාගී වීම.<br>➢ එම සාකච්ඡා වලදී මතුවන සුවිශේෂී තත්වයන් පිළිබඳ දිස්ත්‍රික් ලේකම්ගේ අවධානය යොමු කරවීම. | | |
| **5.මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය ට අදාළව රජය විසින් ගන්නා ප්‍රතිපත්තිමය තීරණ මත සිදු කෙරෙන වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් සම්බන්ධීකරණය කිරීම.** | ➢ ගැබිණි මව්වරුන් සඳහා රු. 20,000/- ක පෝෂණීය දීමනාවක් ලබාදීමේ වැඩසටහන<br>-වැඩසටහනට අදාළ චක්‍රලේඛ හා උපදෙස් අමාත්‍යාංශයෙන් ලබාගෙන නිලධාරීන් වෙත යැවීම.<br>-අදාළ ප්‍රතිපාදන අමාත්‍යාංශයෙන් ගෙන්වා ගැනීම සහ දිස්ත්‍රික්කය තුළ බෙදාහැරීම.<br>-අක්මුදල් ගෙන්වා ගැනීම සඳහා සහාය වීම, සම්බන්ධීකරණය සිදු කිරීම<br>- 06/2016 චක්‍රලේඛයේ ප්‍රගතිය එවීමේ ආකෘති පත්‍රය පරිදි අදාළ මස ප්‍රගතිය මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය වෙත වාර්තා කිරීම.<br>- හිඟ ප්‍රතිපාදන හා අවශ්‍ය වව්චර්පත් කුවිතාංසි පොත් ගණනය කර අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම.<br>- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මට්ටමින් මතුවන ගැටලු/යෝජනා අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම සහ සම්බන්ධීකරණය සිදු කිරීම. | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය ට අදාළව රජය විසින් ගන්නා ප්‍රතිපත්තිමය තීරණ මත සිදු කෙරෙන වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් නිසි ලෙස සම්බන්ධීකරණය කිරීම. | 20 |

| | | | |
|---|---|---|---|
| - | ➢ ගුරු අභිමානී වැඩසටහන.<br>- සුදුසුකම් සපුරන ලද ප්‍රතිලාභීන්ගේ නම් ප්‍රාදේශීය මට්ටමින් ගෙන්වාගෙන මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.<br>- අමාත්‍යාංශය මගින් නිකුත් කරන ප්‍රතිපාදන, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාල මගින් ලබා දෙන ප්‍රතිපාදන මත ප්‍රාදේශීය මට්ටමෙන් ගුරුවරුන් වෙත ප්‍රතිලාභ ලබාදීම හෝ සම්බන්ධීකරණය.<br>- කාර්තුමය ප්‍රගතිය මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ කාර්යාලය වෙත වාර්තා කිරීම.<br><br>➢ පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාර වේල ලබාදීමේ වැඩසටහන.<br>- අදාළ චක්‍රලේඛය හා උපදෙස් පරිදි වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.<br>- දිස්ත්‍රික්කය වෙත අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීම සඳහා තෝරාගන්නා ලද පෙර පාසල් හා පෙර පාසල් දරුවන් ප්‍රමාණය අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම.<br>- ප්‍රාදේශීය මට්ටමේ නව ඉල්ලීම් හා ගැටළු මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණ කටයුතු. | | |
| 6.ප්‍රගතිය හා තොරතුරු වාර්තා කිරීම<br>**(Reporting)** | ➢ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ ප්‍රතිපාදන සහිතව හෝ රහිතව සිදු කිරීම උදෙසා යොමු කරන ලද දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය වැඩසටහන් අදාල කාර්තුව තුල සිදු කොට එම වැඩසටහනෙහි ප්‍රගතිය, වාර්තා කිරීම උදෙසා හඳුන්වා දී ඇති අදාල ආකෘති පත්‍ර යටතේ මුල් ළමාවිය | ප්‍රගතිය හා තොරතුරු වාර්තා කිරීම යාවත්කාලීනව සිදුවේ. | 10 |

| | | | |
|---|---|---|---|
| | සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය වෙත ප්‍රගතිය වාර්තා කිරීම.<br>➢ දිස්ත්‍රික් මට්ටමේ මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කිරීම.<br>➢ මාසිකව මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ප්‍රගති වාර්තාකරණ දත්ත පද්ධතිය ඔස්සේ ප්‍රගතිය වාර්තා කිරීම. | | |
| 7. ළමා කටයුතු විෂය බාර අමාත්‍යාංශය/ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ හෝ දිස්ත්‍රික් ලේකම් විසින් පවරන වෙනත් රාජකාරි | ➢ පවුල් ඒකක සවිබල ගැන්වීමේ ජාතික වැඩසටහනට අදාල දිස්ත්‍රික් ප්‍රගතිය අදාළ අමාත්‍යාංශ වෙත යොමු කිරීම<br>➢ අවස්ථානුකූලව පවරනු ලබන රාජකාරි ඉටු කිරීම. | අවස්ථානුකූලව පවරනු ලබන රාජකාරි අදාළ කාල සීමාව තුළ ඉටුවේ. | 5 |

1.3 දැනුම, නිපුණතා හා හැකියාවන්

**1.3.1 නිපුණතා:**

1. මුල් ළමාවියේ දරුවන්ගේ ගැටළු හඳුනාගැනීමේ කුසලතාවය
2. මුල් ළමාවිය විෂය හා සම්බන්ධ දැනුම.
3. මිනිසුන් සමග කටයුතු කිරීමේ දී මහජන සම්බන්ධතාවය පවත්වාගෙන යාමේ දක්ෂතාවය.
4. සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවේ කථන හා ලිඛිත නිපුණතාවය.

**1.3.2 අපේක්ෂිත නිපුණතා:**

1. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රීය දැනුම.
2. පරිගණක භාවිතය පිළිබඳ මනා දැනුම (MS Office Package පිළිබඳව)
3. යහපත් අන්තර් පුද්ගල කුසලතා
4. ගැටුම්කාරී තත්වයන් සමඟ නම්‍යශීලීව වැඩකිරීමේ හැකියාවහැකියාව සහ පීඩනය යටතේ වැඩකිරීමට ඇති කැමැත්ත.
5. පහසුකම් හාපුහුණු කුසලතා සැපයීමේ හැකියාවසහඅවදානම් සහ අවාසිදායක තත්ත්වයේ වෙසෙන මුල් ළමාවියේ දරුවන් වෙත සංවේදී බව.